# දැන්වීමයි.

## ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ආපනාශාලා සේවය පවත්වාගෙන යාම - සේවක ආපන ශාලාව

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අයත් සේවක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ලංසු කැඳවනු ලැබේ.

ඒ අනුව තේරීපත්වන ලංසු කරුවන්ට ආපනශාලා සේවය 2025 පෙබරවාරි 01 වන දින සිට 2026 ජනවාරි 31 දින දක්වා පවත්වාගෙන යාම සඳහා පවරනු ලැබේ.

ලංසු පත්‍රිකා සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කිරීමෙන් හෝ පැමිණ ලබා ගත හැකි අතර රු. 2,000.00 ක ගාස්තුවක් මේ සඳහා අය කරනු ලැබේ.

සියලු මිල ගණන් ඇතුළත් සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා ලංසුකරුගේ අත්සන හා දිනය යොදා කවරයක බහා මුද්‍රා තබා, වම්පස උඩකෙළවරේ සේවක ආපනශාලා සේවය ලෙස සඳහන් කර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල වෙත 2025.01.21 දින ප.ව. 2.15 ට පෙර හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් මෙම විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසුකරුගේ පළපුරුද්ද , මුදල් තත්ත්වය සහ අනන්‍යතාව සනාථ කිරීම සඳහා අවශ්‍ය සහතිකවල ඡායාරූප පිටපත්ද ලංසු අයදුම්පත් සමඟ එවිය යුතුය.

2025.01.21 දින ප.ව.02.30 පසු වූ වහාම ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නිළධාරියෙකුට පැමිණ සිටිය හැකිය.

මෙම ආපනශාලා සේවය පවත්වාගෙන යාම එක් කොන්ත්‍රාත්කරුවෙකුට පමණක් පවරනු ලැබේ. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ලංසුවක් හෝ ලංසු සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද ප්‍රසම්පාදන කමිටුව සතුය. මෙම ලංසු පිළිබඳව විශ්වවිද්‍යාලීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වන්නේය.

තෝරාගන්නා ලද ලංසුකරු විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. එමෙන්ම ටෙන්ඩරය පිරිනමා දින 07 ක් ඇතුළත මෙහෙයුම් කටයුතු ආරම්භ කළ යුතුය.

Senior Assistant Registrar
General Administration
Uva Wellassa University
Passara Road
Badulla

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
සාමාන්‍ය පාලන අංශය
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය